සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**07 ශ්‍රේණිය** **ක්‍රිස්තු ධර්මය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකය: |
|---|

**I කොටස**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ස්නාවක ජොහාන් තුමාගේ අති විශේෂ මෙහෙය ගැන පවසා ඇති දිවැසිවරයා වන්නේ,

    (1) එසකියල් තුමා ය. (2) යෙසායා තුමා ය.

    (3) ජෙරමියා තුමා ය. (4) ආමොස් තුමා ය.

02. 'සියල්ල නිම විය.' මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ කුරුසියේ දී ප්‍රකාශ කළ,

    (1) පළමු වචනය ය. (2) හතරවන වචනය ය.

    (3) හයවන වචනය ය. (4) හත්වන වචනය ය.

03. ජේසුස් වහන්සේ උත්ථාන වූ බව විශ්වාස නොකළ ගෝලයා වන්නේ,

    (1) ජොහන් තුමා. (2) මතෙව් තුමා.

    (3) ජූදස් තුමා. (4) තෝමස් තුමා.

04. ජුදෙව් පාස්කු මංගල්‍යයට දින කීයකට පසු පෙන්තකොස්ත මංගල්‍යය සිදු වේද?

    (1) දින 10 කට පසු. (2) දින 20 කට පසු.

    (3) දින 40 කට පසු. (4) දින 50 කට පසු.

05. සුදර්ශන දොරටුව අසල දී සුවය ලැබුවේ,

    (1) අංශභාග රෝගියෙකි. (2) ලාදුරු රෝගියෙකි.

    (3) කොර රෝගියෙකි. (4) මහලේ රෝගියෙකි.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

( ක්‍රියා / යාච්ඤා / මිනිසාට / ප්‍රඥාවේ / තෝමස් )

06. දේව මැවිල්ලේ විශේෂ තැනක් ................................................................ හිමි වේ.

07. දේව ගරු බිය පෑම යනු ................................................................ උල්පතයි.

08. 'නිවුන් දරුවා' යැයි නම ලද ගෝලයා ................................................................ ය.

09. පෙන්තකොස්ත සිද්ධිය පිළිබඳව විස්තර සඳහන් වන්නේ ................................................ පොතෙහි ය.

10. ඔබට පීඩා කරන්නන් උදෙසා ................................................................ කරන්න.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

11. දේව මැවිල්ල සුරැකීම මිනිසා සතු ප්‍රධාන වගකීමකි. ( )

12. පරිසිවරු හා සද්දුසිවරු ස්නාවක ජොහාන් තුමාගේ වදන් පිළිගත්තා ලදී. ( )

13. "නුඹේ දෙවි වන සමිදාණන් වහන්සේට නමස්කාර කරන්න." මෙය ජේසුස් වහන්සේ තමන්ට පැමිණි දෙවන පරීක්ෂාවට දුන් පිළිතුරයි. ( )

14. කිතුනු ජීවිතයේ පදනම ඇදහිල්ලයි. ( )

15. අපට විපත්තියක් පැමිණෙන විට අප අපේ ඇදහිල්ල අත්හැර දැමිය යුතුයි. ( )

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට A කොටසේ වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | මැවීම ගැන සඳහන් වන පොත | ජේදුරු තුමා |
| 17. | පෙන්තකොස්ත දින දේශනය කළේ | ජොහන් තුමා |
| 18. | ඔබේ අසල්වැසියාට | නිහතමානීකම |
| 19. | ස්නාවක ජොහාන්තුමා සතු ගුණාංගයකි. | උත්පත්ති |
| 20. | ජේසුතුමා වඩාත් ප්‍රේම කළ ගෝලයා | ප්‍රේම කරන්න. |

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- කෙටි පිළිතුරු සපයන්න.

01. (i) අද සමාජය තුළ දරුවන්ට එල්ල වන පීඩාවන් 02 ක් ලියන්න.

(ii) දේව ගරු බිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබ කළ යුතු දේවල් 02 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා තෝරාගත් ස්ථාන 02 ක් ලියන්න.

(iv) "අප දෙස බලන්නැයි' සුදර්ශන දොරටුව අසල සිටි රෝගියාට පැවසුවේ කුමක්ද?

(v) දේව නිර්මාණයේ අඛණ්ඩ පැවැත්මට උදාහරණ 02 ක් ලියන්න.

(vi) බයිබලයේ සඳහන් 'රන් අණ' ලියන්න.

(vii) ස්නාවක ජොහන් තුමාගේ මව හා පියා නම් කරන්න.

(viii) "මාගේ පාද පමණක් නොව අත් ද හිසද සේදුව මැනව." මෙසේ පැවසුවේ කවුද? කාටද?

(ල. 2 x 8 = 16)

02. (i) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට ආසන්න සිදුවීම් 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) ඉන් ඔබ කැමති එක් අවස්ථාවක් විස්තර කර ලියන්න. (ල. 03)

(iii) දුක් ප්‍රාප්තියට පෙර එම සිදු වූ සිදුවීම් මගින් උන්වහන්සේ ඉගැන් වූ විශේෂ කරුණු 02 ක් ලියන්න. (ල. 06)

03. (i) පෙන්තකොස්ත දිනයේ දී සිදු වූ විශේෂ සිදුවීම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) මුල් සභාව තුළ තිබුණා වූ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබ ඉරිදා පල්ලියට ගොස් කරන දේවල් 03 ක් ලියා ඉන් ඔබට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල. 06)

04. (i) 'රන්වත් රිදීවත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි.' මෙසේ පැවසුවේ කවුද? කාටද? (ල. 02)

(ii) සුවය ලැබූ රෝගියා කළේ කුමක්ද? (ල. 03)

(iii) මෙම සිද්ධිය තුළින් ඔබට ඉගෙන ගත හැකි කරුණු 03 ක් ලියන්න. (ල. 06)

05. (i) කමාව ලැබීමට නම් ඊට ප්‍රථම ඔබ කළ යුතු දේ ලියන්න. (ල. 02)

(ii) ස්වාමීන්ගේ යාච්ඤාව තුළ කමාව පිළිබඳ සඳහන් වන පදය ලියන්න. (ල. 03)

(iii) ඔබට පීඩ කරන අයෙකු වෙනුවෙන් කෙටි යැදුමක් ලියන්න. (ල. 06)

06. (i) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් 02 ක් ලියන්න. (ල. 02)

(ii) කිතුණු ඔබට අද එල්ල වන පරීක්ෂාවන් 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබට එල්ල වන පරීක්ෂාවන්ට මුහුණ දීමට දිරිය හා ශක්තිය පතා යාච්ඤාවක් ලියන්න. (ල. 06)

07. (i) දෙවියන් වහන්සේ මැවිල්ල මිනිසාට භාර දී ලබා දුන් වගකීම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) මිනිසා දේව මැවිල්ල විනාශ කරන ආකාර 03 ක් ලියන්න. (ල. 03)

(iii) දේව මැවිල්ල සුරැකීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (2) 02. (3) 03. (4) 04. (4) 05. (3) 06. මිනිසාට 07. ප්‍රඥාවේ 08. තෝමස්
09. ක්‍රියා 10. යාච්ඤා 11. (✓) 12. (X) 13. (✓) 14. (✓) 15. (X)
16. උත්පත්ති 17. පේදුරු තුමා 18. ප්‍රේම කරන්න. 19. නිහතමානීකම 20. ජොහන් තුමා

(ල. 2 x 20 = 40)

## II කොටස

01. (i) දුප්පත්කම / මව පියා විදේශ ගතවීම / ස්වභාවික විපත් නිසා අනාථ වීම / යුද්ධය නිසා අසරණ වීම / මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම / දෙමාපිය සබඳතා දෙදරා යාම.
(ii) යහපතට මුල්තැන දීම / දේව පනත් වලට කීකරු වීම. / දේව වචනය හැදෑරීම, මෙනෙහි කිරීම. / දිනපතා යාච්ඤා කිරීම.
(iii) කඳු මුදුන් / මිටියාවත් / මුහුදු වෙරළ
(iv) පේදුරු සහ ජොහන්
(v) වැස්ස ඇති වීම / දිවා රෑ ඇති වීම / නව දරු උපත් / බීජයකින් පැළයක් හට ගැනීම. / වඩදිය බාදිය.
(vi) අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද ඔබත් ඒ දේ ම ඔවුන්ට කරන්න.
(vii) මව - එළිසබෙත් පියා - සෙකරියස්
(viii) සීමොන් පේදුරු තුමා විසින් ජේසුස් වහන්සේට (ල. 2 x 8 = 16)

02. (i) අන්ති රාත්‍රී භෝජනය
ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
ගෙත්සෙමනෙහි යාච්ඤාව (ල. 02)
(ii) ලියා ඇති විස්තරය අනුව ලකුණු ලබා දෙන්න. (ල. 03)
(iii) පාප වලට පසු තැවීම / නිහතමානකම / ප්‍රශ්නවලදී යාච්ඤාවට මුල් තැන දීම / නිරතුරුව දේව කැමැත්තට අවනත වීම. (ල. 06)

03. (i) සැඩ සුළඟක් හැමීම / ගිනි දළු වැනි දිව් / අන්‍ය භාෂා වලින් කථා කිරීම. (ල. 02)
(ii) ඉගැන්වීම / සහභාගීකම / රොටී කැඩීම / යාච්ඤාව / සියල්ල පොදුවේ තබා ගැනීම. (ල. 03)
(iii) ගීතිකා ගායනය / යාච්ඤා කිරීම / දේව වචනයට සවන් දීම.
එකමුතුකම වර්ධනය වීම / දේව වචනය ඉගෙන ගත හැකි වීම / ගීතිකා ගායනයේදී ගායන හැකියා වර්ධනය වීම / වාදන හැකියාව වර්ධනය වීම / යාච්ඤා කිරීම ගැන ඉගෙන ගත හැකි වීම. (ල. 06)

04. (i) පේදුරු තුමා කොර රෝගියාට (ල. 02)
(ii) ඇවිදිමින් උඩ පනිමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා. (ල. 03)
(iii) ජේසුස් වහන්සේ අපේ පාප වලට කමාව හා රෝග වලට සුවය ලබා දෙනබව/අද දවසේත් ශුද්ධාත්මයාණන් වහන්සේ සුවය ලබා දෙනබව / මිල මුදලට සුවය ලබා දිය නොහැකි බව / ප්‍රශංසාව වැදගත් බව. (ල. 06)

05. (i) කමාව ඉල්ලීම / කමාව දීම. (ල. 02)
(ii) අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි වලට ද කමා වුව මැනව. (ල. 03)
(iii) ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කිරීම / සියළු යස ඉසුරු පෙන්වා ඒ සියල්ල දෙන බැවින් යක්ෂයාට නමස්කාර කිරීම. දේව මාළිගාවේ කොත මුදුනින් පහළට පැනීම. (ල. 02)
(ii) විභාගයේ දී කොපි කිරීම / සොරකම් කිරීම / මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම / අනික් අයට පහර දීම / දුරකථන වලට ඇබ්බැහි වීම. (ල. 03)
(iii) ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

07. (i) දරු සම්පත් ලැබීම / සතුන් ආරක්ෂා කිරීම පාලන කිරීම / භූමිය රැකගෙන වගා කිරීම / මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම. (ල. 02)
(ii) ගස් කැපීම / වායු දූෂණය / පරිසර දූෂණය / ජලයට අප ද්‍රව්‍ය බැහැර කිරීම. (ල. 03)
(iii) පරිසරය සුරැකීම / ගස් වැවීම / ජල සම්පත සුරැකීම / පොලිත්න් භාවිතා නොකිරීම / වන සතුන් ආරක්ෂා කිරීම..... (ල. 06)